(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 143.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

2026 අප්‍රේල් 09 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1187/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පෙර පාසල් පවත්වාගෙන යනු ලබන අතර, එම පෙර පාසල්වල ඉගැන්වීමේ කටයුතුවල නිරත ගුරුවරුන්ට වැටුප් ගෙවීම් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන බව දන්නේද;

(ii) එම දිස්ත්‍රික්කයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පෙර පාසල්වල සේවය කරන, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වැටුප් ගෙවනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව සහ ඔවුන්ට ගෙවනු ලබන මුළු මාසික වැටුප කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පෙර පාසල්වල සිසුන්ගේ නිල ඇඳුම් සඳහා දෙමාපියන්ගෙන් මුදල් අය කරගනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, එක් දරුවෙකුගෙන් අයකරනු ලබන මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම මුදල අය කිරීමට හේතු කවරේද;

(iv) එම නිල ඇඳුම්වල හමුදා ලාංඡනය යෙදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම පෙර පාසල් පළාත් සභාව යටතේ පවතින බව දන්නේද;

(ii) එසේ නම්, ඒවා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවීම සඳහා වන නෛතික පදනම කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1408/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයට අයත් වවුනියාව, මන්නාරම හා මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්කයන්හි තමන්ටම හිමි ඉඩම්වල ජීවත් වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් අතරින්, රජයෙන් නීත්‍යානුකූල ඉඩම් බලපත්‍ර ලබා ඇති සහ ඉඩම් බලපත්‍ර ලබා නොමැති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම දිස්ත්‍රික්කයන්හි පදිංචි ජනතාවගේ ඉඩම් සම්බන්ධ ගැටලු විසඳීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සම්පාදනය කර තිබේද;

(iv) එසේ නම්, එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

(v) පසුගිය රජය සමයේදී ක්‍රියාත්මක කරන ලද ‘උරුමය’ වැඩසටහන යළි ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1473/2025

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ තලෙයිමන්නාරම ප්‍රධාන මාර්ගයේ බටහිර තාරාපුරම් ග්‍රාම සේවා කොට්ඨාසයේ, නිම නොකර අතහැර දමන ලද සමූපකාර ගම්මාන ව්‍යාපෘති ගොඩනැගිලි දෙකක් ඇති බව දන්නේද;

(ii) එම ඉදිකිරීම් සඳහා, මන්නාරම ප්‍රාදේශීය සභාවේ අනුමතිය ලබා ගෙන තිබේද;

(iii) ඒවා ඉදිකළ අරමුණ කවරේද;

(iv) ඉහත ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාව ඇතුළු සියලු බලපත්‍ර ලබා ගෙන තිබේද;

(v) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කිසියම් විමර්ශනයක් පවත්වා තිබේද;

(vi) එසේ නම්, එහි වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රකාශන ඔප්පුවක් මඟින්, ශ්‍රී ලංකා සීමාසහිත ව්‍යවසායක සංවර්ධන සමුපකාර සංගමය විසින් නීති විරෝධීව හිමිකාරිත්වය ලබාගත් ඉඩමක මෙම ගොඩනැගිලි ඉදිකර ඇති බව දන්නේද;

(ii) ඉහත ව්‍යාපෘතිය සඳහාම පිහිටුවා, එම අමාත්‍යාංශයේම ලියාපදිංචි කර ඇති, අක්‍රිය තත්ත්වයේ පවතින මෙම සංගමයේ ලියාපදිංචි ලිපිනය, ලියාපදිංචි කළ දිනය සහ ලියාපදිංචි අංකය කවරේද;

(iii) එහි ව්‍යවස්ථාවේ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

(iv) එහි සභාපතිතුමිය සහ අනෙකුත් සාමාජිකයින්ගේ නම්, පෞද්ගලික ලිපිනයන් ඇතුළු ඔවුන්ගේ විස්තර කවරේද;

(v) එමඟින් මෙතෙක් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති පිළිබඳ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1503/2025

ගරු බී. ආරියවංශ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගා කරන ලද භූමි ප්‍රමාණය සහ ගම්මිරිස් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව දිස්ත්‍රික්ක මට්ටමෙන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාලය තුළ ගම්මිරිස් අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ගම්මිරිස් වගාකරුවන් තවදුරටත් දිරිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1545/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතු ප්‍රජාව ජීවත් වන ඉඩම් සඳහා නිරවුල් හිමිකම් ඔප්පු නොලැබීම හේතුවෙන් විවිධ අවස්ථාවලදී ඔවුන් අපහසුතාවයන්ට පත්වන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1640/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය උත්ශ්‍රේණිගත කර නොමැති බවත්, ඒ හේතුවෙන් මහජනතාවට සිදුවන අපහසුතා පිළිබඳවත් දන්නේද;

(iii) එම උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස උත්ශ්‍රේණිගත නොකිරීමට හේතු කවරේද;

(iv) එම උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස උත්ශ්‍රේණිගත කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1673/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සින්න උල්ල, අරුගම්බේ, සර්වෝදයපුර, ජලාල්දීන් චතුරස්‍රය, කුඩා කල්ලිය, විස්කි පොයින්ට්, කොට්ටුක්කල් සහ ලයිට් හවුස් වැනි සංචාරක ප්‍රදේශවල නිවාඩු නිකේතන පවත්වාගෙන යන පුද්ගලයන් සතු ඉඩම් සඳහා රජය විසින් මැනුම් සිදුකර ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(ii) එම ලිපිලේඛන නොමැති නිවාඩු නිකේතන, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීමට නොහැකි බව පිළිගන්නේද;

(iii) ඒ හේතුවෙන් පොතුවිල් ප්‍රාදේශීය සභාවට අදාළ ව්‍යාපාර බදු අය කිරීමට නොහැකිවී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය යටතේ පෞද්ගලික මැනුම්කරුවන් මඟින් ඉඩම් මැනුම් සිදුකර 'උරුමය' ඔප්පු කඩිනමින් ලබා ගැනීමට අවස්ථාවක් ලබා දෙන්නේද;

(v) එසේ සකස් කරන මිනින්දෝරු සැලසුම් භාවිතා කර එම ඉඩම් 'උරුමය' යෝජනා ක්‍රමයට ඇතුළත් කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1853/2026

ගරු රොෂාන් අක්මීමන මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය වරාය පසුගිය වර්ෂ 15ක කාලය තුළ ලබා ඇති මෙහෙයුම් ලාභය හෝ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වරායට අයත්ව තිබූ ජැටි හෝ පර්යන්ත, පසුව විවිධ පෞද්ගලික සමාගම් වෙත බදු පදනම මත හෝ වෙනත් පදනමක් යටතේ ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(iv) එම සමාගම් විසින් වරාය අධිකාරියට ගෙවිය යුතු බදු හෝ වෙනත් ගෙවීම් නිසි පරිදි සිදු කර තිබේද;

(v) එසේ නම්, පසුගිය වර්ෂ 20ක කාලය තුළ එම ගෙවීම් සම්බන්ධ විස්තර කවරේද;

(vi) මේ වනවිට ත්‍රිකුණාමල වරාය තුළ රජයට පූර්ණ, අර්ධ හෝ යම් ප්‍රමාණයක හිමිකාරිත්වයක් පවතින ජැටි හෝ පර්යන්ත තිබේද;

(vii) එසේ නම්, ඒවා කවරේද;

(viii) ත්‍රිකුණාමල වරාය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පවතින සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1861/2026

ගරු රුවන් විජේවීර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේදී පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස බඳවාගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම බඳවාගැනීමට අදාළ මූලික සුදුසුකම් කවරේද;

(iii) පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස ඔවුන්ගෙන් අපේක්ෂිත කාර්යභාරය කවරේද;

(iv) මේ දක්වා එම තනතුරේ සේවය කරන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1905/2026

ගරු ආර්.ජී. විජේරත්න මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හඟුරන්කෙත තානායම අමාත්‍යාංශයේ විෂයපථයට අයත් බවත්;

(ii) එහි නීති විරෝධී ක්‍රියා සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්තමානයේ එම තානායම පවත්වාගෙන යනු ලබන පුද්ගලයාගේ නම කවරේද;

(ii) ඔහුට එම තානායම භාරදී ඇති පදනම කවරේද;

(iii) ඔහු එම තානායම පවත්වාගෙන යනු ලබන කාලය කවරේද;

(iv) රජයේ තානායම්වලින් ඵලදායි සේවාවක් ලබා ගැනීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

### පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන),— 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන),— 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

### යෝජනා පිළිබඳ දැනුම්දීම

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 4 සහ 5 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 2.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— කොළඹ වරායේ සිට බහාලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— කොළඹ වරායේ සිට බහාලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2025 නොවැම්බර් 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබාදී ඇති කාලසීමාව, 2026 ජූලි 21 දින දක්වා දීර්ඝ කළ යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— යුද්ධ හමුදා පනත යටතේ නියෝග,— (357 අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ 29 සහ 155 වගන්ති යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— නාවික හමුදා පනත යටතේ නියෝග,— (358 අධිකාරය වූ) නාවික හමුදා පනතේ 161 වගන්තිය යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ගුවන් හමුදා පනත යටතේ නියෝග,— (359 අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ 29 සහ 155 වගන්ති යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය,— 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2026 මාර්තු 28 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*5.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2026 මාර්තු 28 දිනැති අංක 2481/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2026.04.07 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*6.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

බේරාගැනීම, පුනරුත්ථාපනය සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*12.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

13.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

14.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (අවලංගු කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.